# ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2026 ඔක්තෝම්බර් මස 16 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. <u>තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය</u>

සුදුසුකම් :

(i). අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙහි ඕනෑම විෂය ධාරාවක් යටතේ එක වරකදී විෂයයන් තුනක් සමත්ව තිබිය යුතුය.

සහ

(ii). (අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික /බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාලව ජාතික වෘත්තීය නිපුණතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකපත් ලබා තිබීම.

හෝ

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ඉහත (2) (අ) කොටසෙහි සුදුසුකම් වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාලව ලබා ගත් තාක්ෂණික සුදුසුකම් සමග පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පලපුරුද්දක් ලබා තිබීම.

වයස **:** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : U – MT1(III ) - රු.51,095–7x540;10x640- 60,575/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය **:** ලිඛිත පරීක්ෂණයක් හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

2. <u>විදුලි කාර්මික (III ශ්‍රේණිය)</u>

සුදුසුකම් :

1. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වෙනත් : සෑම අයදුම්කරුවකුම,

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : U – PL 3(III ) - රු.48,005–16x490- 55,845/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 3. බංගලා භාරකරු හා අරක්කැමි (III ශ්‍රේණිය)

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පලපුරුද්දක් ලබා තිබීම.

වෙනත් : සෑම අයදුම්කරුවකුම,

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : U – PL 2(III ) - රු.44,575–16x490- 52,415/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 4. විද්‍යාගාර සහායක (III) ශ්‍රේණිය

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික /

වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පලපුරුද්දක් ලබා තිබීම.

වෙනත් **:** සෑම අයදුම්කරුවකුම,

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

වයස **:** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : U – PL 2(III ) - රු.44,575–16x490- 52,415/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය **:** වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 5. <u>වැඩ සහායක (III ශ්‍රේණිය)</u>

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

වෙනත් **:** සෑම අයදුම්කරුවකුම,

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

වයස **:** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :U – PL 1(III ) - රු.42,775–16x450- 49,975/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය **:** වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 6. <u>හෙද නිලධාරී (කොන්ත්‍රාත් පදනම)</u>

සුදුසුකම් **:**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් තුනකට සම්මාන සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

2. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ හෙද සහතිකය ලබා තිබිය යුතුය.

| | | |
|---|---|---|
| මාසික වැටුප | : | රු.51,095/- + 17,800/-(ජීවන වියදම් දීමනාව) + UPF+ETF |
| වයස | : | අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි |
| බඳවා ගැනීමේ ක්‍රමය | : | සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| කොන්ත්‍රාත් කාලය | : | අවුරුදු 01 |

ඉහත තනතුරු 1 සිට 5 දක්වා වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ ඊට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ. තෝරාගත් අපේක්ෂකයා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකු වනු ඇත. ඔහුගේ / ඇයගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක කල යුතු අතර ඒ සමඟම, සේවා යෝජකයා විසින් සේවකයාගේ වැටුපෙන් 15% කට සමාන මුළු දායකත්වයක් ලබා දෙනු ඇත. (6 වන තනතුර හැර අනෙක් තනතුරු සඳහා එයින් 8%ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කෙරේ). 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් 3% ක් සේවක භාර අරමුදලට දායක කරනු ලැබේ.

අයදුම් කිරීම සඳහා උපදෙස් සහ ආදර්ශ අයදුම්පත ශ්‍රී පාලි මණ්ඩප වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය. **(https://spc.cmb.ac.lk/)**

අදාළ අධ්‍යාපනික, වෘත්තීය, විෂය බාහිර සහ සේවා සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පිටපත් ඉහත සඳහන් කරන ලද අයදුම්පතට අමුණා **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ** වෙත **2026.10.16** දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. **අසම්පූර්ණ, අතින් ලියන ලද, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සත්‍ය පිටපත් බවට (සුදුසුකම් ලත් තැනැත්තෙකු ලවා*) සහතික කරන ලද පිටපත් අමුණා නොමැති සහ ආකෘති පත්‍ර භාවිතයෙන් ඉදිරිපත් කරන ලද හෝ අයදුම්පත් කැඳවන අවසන් දිනට පසුව ලැබෙන** අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිඳු තත්ත්වයක් යටතේ නැවත සලකා බලනු නොලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ/හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් එම ආයතනවල ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ශ්‍රී පාලි මණ්ඩපය
ලේඛකාධිකාරී වෙනුවට

2026.09.23

(* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක විධායක හෝ පරිපාලන නිලධාරියෙකු / මහාචාර්යවරයෙකු /අංශාධිපතිවරයෙකු / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හෝ රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම සේවක, සමාදාන විනිශ්චයකාරවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරණ කෙනෙකු ලවා සහතික කරවා ගත යුතුය)